# පත්තරයක් ගන්න සහෝදරයා




ගාලු නගරය කොහොමත් උණුසුම්ය. සාගරය දෙසින් හමා එන සුළඟ කෙතරම් දැඩි වුව ද සිසිල් වුව ද ඒ උණුසුම පහව නොයයි. කොටුවේ මහ පවුරේ වැදී විසිරෙන සුළඟ බස් නැවතුම හරහාද ඇදී යන්නේ අප අත වූ නියමුවා පත්තර මිටියද විසුරුවා දමමින් ය.

මා සිටියේ සුගත් හා සමරේ සොයුරන් සමගිනි. පෙරමුණ ගෙන සිටියේ සමරපාල සහෝදරයාය. ඔහු අප අතරින් මැඩිමලා ය. මම බාලයා වීමි. උසස් පෙළ විභාගය ලියා හමාර කළ සැණින් මම ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණකාලිකයකු ලෙස අරගලයට එක්වුණෙමි. අසාධාරණයට එරෙහි වෙන්නෙමැයි මසිත වූ තරුණ අභිලාශත් මගේ පවුල් පසුබිමත් මේ තීරණයට උපකාර වන්නට ඇතැයි අද මට සිතෙයි.

මගේ ජීවිතය උඩු යටිකුරු කළ ඒ දෛවෝපගත තීරණය පිළිබඳ අද පවා මගේ සිතේ කණගාටුවක් නැත . එය එසේ සිදුවිය යුතුව තිබුණි. අසාධාරණයට එරෙහිව කිසිවකු හෝ නැගී නොසිටින්නේ නම් මේ සියල්ල නිවැරදි කරන යාන්ත්‍රණය ඇන හිටිනු ඇත . එය සිදුවිය නොයුතු දෙයකි. ඉතිහාසය පුරාම සැම කාලයකම අසාධාරණයට එරෙහිව නැගී සිටි මිනිස්සු සිටියහ. ඒ නැගී සිටීම් විවිධ මුහුණුවරින් වන්නට ඇති නමුත් අවසාන විග්‍රහයේදී ඒ සියළු නැගී සිටීම් ජනතාව වෙනුවෙන් වූ නැගී සිටීම් ය. අරගලයේ ස්වභාවය හා තීරණය වූයේ ඒ ඒ කාල වකවාණු වල පැවති සමාජ දේශපාලන වාතාවරණය අනුව ම ය.

මගේ පියා 71 කැරැල්ලට අසුවී සිරබත් කෑ බව මා සැඟවිය යුතු නැත. පසුව ඉන් නිදහස්ව විදුහල්පතිවරයකු බවට පත් වූ ඔහුගේ විප්ලවවාදී අදහස් මගේ ජීවිතයට කාන්දු වෙමින් තිබුණි. ඔහු මා යන ගමන දෙස බලා සිටියේ උපේක්ෂාවෙනි. මා උනන්දු කරවන්නට හෝ මට විරුද්ධවන්නට හෝ ඔහුගේ උත්සාහයක් නොවීය. දිගින් දිගටම සම්ප්‍රදායික අධ්‍යාපනයේ නිරත වන්නට මසිත තුළ උනන්දුවක් නොවීය. මම විප්ලවාදී පොත පත ඇසුරු කරන්නට පටන් ගත්තෙමි. මාක්ස්වාදය පිළිබඳ ලියැවුණු පොත් පත් සොයා ගෙන ස්වයං අධ්‍යයනයක් ලැබුවෙමි.

***අප මේ ප්‍රචාරය කරමින් සිටින්නේ ජනප්‍රිය මතවාදයක් නොවේ. බොහෝ අය තිත්ත කසාය මෙන් බැහැර කළ දේශපාලන න්‍යායක් මේ සාමාන්‍ය මිනිසුන්ගේ සිත් තුළට ඇතුල් කළ හැකි වන්නේ කෙසේද යන්න ඒ යුගයේත් මගේ සිතේ තිබූ විශාල පැනයක් විය.***

තාත්තාගේ හැඳුණුම් කම් මත ජනතා විමුක්ති පෙරමුණෙ නායකයෝ අපේ නිවසට ආව ගියහ. ඔවුන් අතරින් කෙලී සේනානායක මගේ සිත් ගත්තේය. මම ඔහුට සමීප වීමි. මා එම පක්ෂයට ඇදී යන්නේ ඔහු පසු පසින්ය. සැබැවින්ම කියනවා නම් පක්ෂයේ කිසිවකු මට කොක්කක් ගැසුවේ නැත. සමාජ අසාධාරණය පිළිබඳ මහත් ආවේගයකින් සිටි මම ම ස්වේච්ඡාවෙන් පක්ෂයට සම්බන්ධ වුණෙමි. පන්ති පහට සහභාගි වුණෙමි. ප්‍රචාරක අංශයේ වැඩ කළෙමි.

මේ කාලයේ කොළඹ ආමර් වීදියේ වඩු මඩුවක උඩ තට්ටුවේ අපේ පක්ෂ කාර්යාලයක් විය. මම සෑම සතියකම මේ කාර්යාලයට ගොස් අවශ්‍ය කරන ලිපි ද්‍රව්‍ය ඔසවාගෙන ආවෙමි. පෝස්ටර් මිටි කර තබාගෙන අවෙමි. තරුණයකු ලෙස අනෙක් තරුණයන් අතර වූ සමනල සිහින දකිනවා වෙනුවෙට මම මගේ ජීවිතයම සමාජය වෙනුවෙන් කැප කරමින් සිටියෙමි.

පෝස්ටර මිටියත් තුරුළු කරගෙන බසයෙන් ගාල්ලට එන මා ළඟින් වාඩිවන යොවුන් වියේ ගැටිස්සියන් ගැන සිතන්නට මට කාලයක් නොවීය. මගේ සිත රැඳී තිබුණේ යොවුන් ආදරයට වඩා උදාර අරමුණු කෙරෙහිය. මම මේ සමාජය වෙනස් කරන්නට කැපවූ අතලොස-"සක් වන තරුණයන්ගෙන් කෙනෙකිය යන හැඟීම පවා මට මහත් ආශ්වාදයක් ගෙන දුන්නේ ය. විමුක්ති ගී ය අපේ සිත් තුළ නිරන්තරව ගැයුණි

# විප්ලවවාදියකුගේ සැබෑ කතාව 1

**සැබෑ මිනිසකු කියන සත්‍ය කතාව**
**අසා ලියන්නේ**
**ජගත් ජේ එදිරිසිංහ**

කඳු යාය මත වැතිරී
තේ නිල්ල හිමිදිරියේ
පිනි කඳුළු සළන්නේ
වේදනා ගැන වේදනාවෙන්දෝ

මේ කියන කාල වකවානුව ඔබට මවා ගත හැකි යයි සිතමි. නවීන මුද්‍රණ තාක්ෂණයේ පහස නොලැබූ අපට පෝස්ටරයක් ඇඳීම පවා අතින් කරන්නට සිදුවී තිබුණි. දැන් කාලයේ මෙන් කුලියට පෝස්ටර් අලවන්නට මිනිසුන් නොසිටි ඒ

කාලයේ අපිම මහ රාත්‍රියේ පාප්ප බාල්දියත් පෝස්ටර් මිටියත් ඔසවාගෙ පය ගෙවෙන තෙක් ඇවිද පෝස්ටර ඇලවූයෙමු. අපට යාන වාහන නොතිබුණි. මේ සියල්ල සිදු කරන්නට තරම් දැඩි කැපවීමක් තරුණ අප සිතේ විය.

අපි සතිපතා ගාල්ල බස් නැවතුමේ නියමුවා පත්තර වික්කෙමු.

"පොඩ්ඩක් කවර් එකේ හිටපං.. මිනිස්සු කියයි ප්‍රින්සිපල්ගෙ පුතා පත්තර විකුණනවා කියල" සුගත් කියයි. මා පත්තර විකුණන බව තාත්තා දන්නා බව ඔහු දන්නේ නැත. මා කියන්නට යන්නේද නැත. ඉස්කෝලෙ මහත්තයාගේ පුතා ජේවීපීකාරයෙක් ය යන්න ගම ම දන්නවා ඇත. ගෙහේ කටු උල් කරන්නට අවශ්‍ය නැති බව ද ඔවුන් දන්නවා ඇත.

දන්නා හඳුනන පාසල් මිතුරන් හමුවන විට හිතට ලැජ්ජාවක් වැනි හැඟීමක් නොදැනුණා නොවේ. එහෙත් ලජ්ජාව වැනි ප්‍රාථමික හැඟීම් වලට මගේ විප්ලවවාදී අදහස් යටපත් කළ නොහැකිය. මම කිසිදු අමුත්තක් නොපෙන්වා ඔවුන් සමග සිනාසෙමි.

"පත්තරයක් ගන්න සහෝදරයා" යි ආරාධකා කරමි. මතුපිටෙන් නොපෙන්වුවද සමහර විට ඔවුන් සිත යටින් මට සිනාසෙන්නටත් ඇත. අප මේ ප්‍රචාරය කරමින් සිටින්නේ ජනප්‍රිය මතවාදයක් නොවේ. බොහෝ අය තිත්ත කසාය මෙන් බැහැර කළ දේශපාලන න්‍යායක් මේ සාමාන්‍ය මිනිසුන්ගේ සිත් තුළට ඇතුල් කළ හැකි වන්නේ කෙසේද යන්න ඒ යුගයේත් මගේ සිතේ තිබු විශාල පැනයක් විය.

අපේ වදන් බොහෝ අයගේ සිත් තුළ නොරැඳී සුළඟේ ගිය බව මට වැටහෙන්නේ බොහෝ කාලයක් ගතවී ඉතා අප්‍රසන්න අත්දැකීම් රැසකට මුහුණ දීමෙන් පසුවය. මා මේ කියමින් සිටින්නේ ඒ කතාවයි.

ඉතින් ගාල්ල බස් නැවතුම හෙවණේ තවමත් අපි පත්තර විකුණන්නෙමු. මිනිස්සු යති එති. කතා කරති. කිසිවක් වෙනස් වී නැත. වෙනස් කිරීම කෙතරම් අපහසු දෙයක්ද?

සමරපාල ශූරයෙකි. ඔහු පත්තර විකුණන්නේ කවි ගායනා කරමින්ය. ඒවා විප්ලවීය ජීව ගුණය සහිත කවි ය. ඒවා අපට කට පාඩම්ය. අපි දෙදෙනා ඔහුට අත්වැල් ඇල්ලුවෙමු. එවන් කැපවීමක් සඳහා අපට කොතරම් ශක්තියක් තිබෙන්නට ඇතිද යන්න ගැන අද පවා මගේ සිතේ ඇත්තේ විමතියකි.

අදිරද බැඳුම් බිඳ දා ලන්න එක්වෙයව්
අද අද නැගෙව් හෙට වනතුරු කල් නොදමව්

රටේ සාමාන්‍ය නීතිය පැවති මේ කාලයේ පක්ෂය කටයුතු කරමින් සිටියේ නීත්‍යාණුකූල පසුබිමකය. අපට තහනමක් නොවීය. බස් නැවතුමේ සිටින පොලිස් භටයන් පවා අප දන්නා හඳුණන අය විය.

**මතු සම්බන්ධයි**